බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර ඇගයීම - 2018

## ගණිතය

**නම : ..........................................................................................** **6 ශ්‍රේණිය**

**කාලය : පැය දෙකයි**

## I කොටස

*** ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

01. වෘත්තාකාර හැඩ දැකිය හැකි වස්තූන් දෙකක් නම් කරන්න.

........................................................................ ........................................................................

02. සංඛ්‍යා නාමය ලියන්න.

1 000 001 - ..........................................................................................................................................

03. අඩු කරන්න.

2000 - 648 = ...............................................

04. ගුණ කරන්න.

648 x 10 = ...................................................

05. මිනිත්තු වලින් ලියන්න.

පැය 2 = ...................................................

06. සම්මත ආකාරයට ලියන්න.


ප.ව. 2.15 = ..................................................

07. එකතු කරන්න.

| මිනිත්තු | තත්පර |
|---|---|
| 6 | 1 3 |
| 2 | 3 2 |
| | |

08. කොළඹින් ප.ව. 2.05 ට පිටත් වූ රථයක් කළුතරට ළඟා වන විට වේලාව ප.ව. 3.40 විය. ගමනට ගත වූ කාලය සොයන්න.

09. පහත සංඛ්‍යා රේඛාවේ (-1) හා 3 ලකුණු කරන්න.




10. අවරෝහණ පටිපාටියට ලියන්න.

2, 0, -1, 3 ...................................................

11. ආසන්න 10 ගුණාකාරයට වටයන්න.

45 ....................................................

12. පහත රූප අතුරින් කෝණ දැක්වෙන රූප තෝරා යටින් ඉරක් අඳින්න.



(i) (ii) (iii) (iv)

13. අනු දිශා නම් කරන්න.

..........................................................................................

14. තලයක තිරස් බව හඳුනා ගැනීමට භාවිත කරන උපකරණය ලියන්න.

..........................................................................................

15. ඉලක්කමින් ලියන්න.

එකසිය තුන් දහස් දෙසිය විසි අට - ..........................................

16. බෙදන්න. 162 ÷ 3

17. මිනිත්තු හා තත්පර වලින් ලියන්න.

තත්පර 125 - ..................................................

18. 1628 හි 6 න් නිරූපණය වන අගය ලියන්න.

........................................................................

19. අද දිනය සම්මත ආකාරයට ලියන්න.

........................................................................

20. වචනයෙන් විස්තර වන ආකාරය ලියන්න.

(i) $4 > 2$ - ........................................................................................................

(ii) $-2 < 1$ - ........................................................................................................

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**පළමු වාර ඇගයීම - 2018**

**ගණිතය**

6 ශ්‍රේණිය

## II කොටස

* පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

* පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 11 බැගින් ද හිමි වේ.

* වෙන ම කඩදාසිවල පිළිතුරු ලියන්න.

---

**01.** (a) පහත දී ඇති ප්‍රකාශ සත්‍ය නම් "ස" ද, අසත්‍ය නම් "අ" ද අදාළ අංක යටතේ ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) පැයක කාලයක් තුළ මිනිත්තු කටුව සම්පූර්ණ වටයක් කරකැවේ.

(ii) මධ්‍යාහ්න 12 සිට මධ්‍යම රාත්‍රී 12 දක්වා ඇති කාලය පෙරවරු ලෙස හැඳින්වේ.

(iii) විශාලත්වයෙන් සෘජුකෝණයට වඩා අඩු කෝණ සුළු කෝණ ලෙස හැඳින්වේ.

(iv) දිශාව සෙවීමට මාලිමාව යොදාගත හැක.


(v) ජලය පිරවූ විශාල බේසමක, ජලය නිශ්චලව ඇති විට ජලයේ මතුපිට සිරස් තලයක් ලෙස සලකනු ලැබේ.

(b) සුළු කරන්න.

(i) 4878 + 299 (ii) 2007 - 199 (iii) 362 x 32 (iv) 3211 ÷ 19

(c) මගීන් 592 ක් එකවර ප්‍රවාහනය කිරීමට අවශ්‍යව ඇත. මේ සඳහා මගීන් 45 ක් ගෙන යා හැකි බස් රථ කීයක් යෙදවිය යුතුද?

**02.** ළමුන් පස් දෙනෙකුගේ වයස දැක්වෙන සංඛ්‍යා රේඛාවක් පහත දැක්වේ.




(i) වැඩිමහල් ම ළමයා කවුද? (ii) B ගේ වයස කීයද?


(iii) සමාන වයසින් යුත් අයගේ නම් ලියන්න.

(iv) සංඛ්‍යා රේඛාවෙන් නිරූපිත වයස් ප්‍රමාණ " > " ලකුණ යොදා සම්බන්ධ කරන්න.

(v) A ගේ වයස මෙන් 4 ගුණයක් වයස ඇති ළමයාගේ නම ලියන්න.

(vi) H ළමයාගේ වයස අවුරුදු 10 කි. එය සංඛ්‍යා රේඛාවේ ලකුණු කරන්න.
(සංඛ්‍යා රේඛාව පිටපත් කර ගන්න.)

**03.** පහත රූපවල කෝණ 8 ක් a සිට h තෙක් අක්ෂරවලින් හඳුන්වා ඇත. එම අක්ෂර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) සුළු කෝණ දැක්වෙන අක්ෂර ලියන්න. (ii) මහා කෝණ දැක්වෙන අක්ෂර ලියන්න.

(iii) h මගින් දක්වා ඇති කෝණ වර්ගය කුමක්ද?

(iv) සෘජු කෝණ දෙකකට සමාන කෝණයක් දැක්වෙන අක්ෂරය ලියන්න.

(v) උතුරට මුහුණලා සිටින අයෙකු නැගෙනහිර දෙසට හැරීමේ දී සෑදෙන කෝණ වර්ගය දැක්වෙන අක්ෂරය කුමක්ද?

**04.** (a) ප්‍රධාන දිශා නම් කරන්න.

(b) එදිනෙදා ජීවිතයේ දී දිශා පිළිබඳ දැනුම භාවිතා වන අවස්ථා දෙකක් ලියන්න.

(c) පාසල් භූමියක පිහිටි ස්ථාන හතක් A සිට G දක්වා අක්ෂර වලින් දැක්වේ.


(i) A ට උතුරින් පිහිටි ස්ථානයක් නම් කරන්න.

(ii) A ට කුමන දිශාවෙන් E පිහිටා ඇත්ද?

(iii) හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු අදාළ අංක යටතේ ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(අ) D ට ................................ දිශාවෙන් A පිහිටා ඇත.

(ආ) C ට උතුරින් ................................ හා ................................ ස්ථාන පිහිටා ඇත.




**05.** (a) එදිනෙදා ජීවිතයේ දී නිමානය භාවිත කරන අවස්ථා දෙකක් නම් කරන්න.

(b) පන්තියක සිටින සිසුන් ගණන ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට 30 ක් විය. එම පන්තියේ සිටිය හැකි,

(i) අඩු ම සිසුන් සංඛ්‍යාව කීයද?

(ii) වැඩි ම සිසුන් සංඛ්‍යාව කීයද?

(c) කර්මාන්ත ශාලාවක සිටින සේවකයින් ගණන ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට 50 ක් වේ. එම කර්මාන්ත ශාලාවට අළුතින් සේවකයින් 9 දෙනෙකු බඳවා ගන්නා ලදි. දැන් සිටින සේවකයින් ගණන ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට පිළිතුර 50 වේ. කර්මාන්ත ශාලාවේ කලින් සිටි සේවකයින් ගණන කීයද?


**06.** (a) 2, 5, 9 යන සංඛ්‍යාවලින් සුදුසු සංඛ්‍යා යොදා පහත හිස්තැන් පුරවන්න.

(i) 5 < .......... (ii) 5 > .......... (iii) 5 = ..........

(b) -3 හා 2 අතර ඇති නිඛිල සියල්ල ලියන්න.

(c) -5 සිට 1 තෙක් ඇති ඍණ නිඛිල අවරෝහණ පටිපාටියට ලියන්න.

**07.** (a) මෙහි දැක්වෙන රූපයේ,




(i) වෘත්තය තුළ පිහිටි ලක්ෂ්‍ය නම් කරන්න.

(ii) වෘත්තයෙන් පිටත පිහිටි ලක්ෂ්‍ය නම් කරන්න.

(iii) වෘත්තය මත පිහිටි ලක්ෂ්‍ය නම් කරන්න.

(b) සුළු කරන්න.

(i)

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 3 | 12 |
| + | 4 | 27 |

(ii)

| | දින | පැය |
|---|---|---|
| | 2 | 20 |
| + | 3 | 15 |

(iii)

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 4 | 15 |
| − | 2 | 25 |